Australian Government
Department of Home Affairs

AMEP
Adult Migrant English Program

# සංක්‍රමණික වැඩිහිටියන් සඳහා ඉංග්‍රීසි වැඩසටහනේ (Adult Migrant English Program) ළමා සුරකුම් සේවා

Adult Migrant English Program (AMEP) පංතිවලට සහභාගී වීමට ඔබට ළමා සුරකුම් සේවා අවශ්‍යද?ඔබ AMEP පංතියේ සිටින අතර පාසැල් යන වයසට පහළ සිටින ඔබේ දරුවන් නොමිලේ රැක බලා ගැනීමේ සේවා ලබා ගත හැක.

ඔබේ AMEP සේවා සපයන්නා ඔබේ නිවසේ හෝ AMEP පංතියේ සිට විනාඩි 30ක් ඇතුළත නොමිලේ ළමා සුරකුම් පහසුකම් ඔබට පිළියෙල කර දීමට උත්සාහ කරනු ඇත. මෙය සෑම විටකම සිදු කිරීමට නොහැකි විය හැක. ඔබට ආසන්නතම ස්ථානය තෝරා ගැනීමට AMEPසේවා සපයන්නන් සිය උපරිම උත්සාහය දරනු ඇත.

AMEP සේවා සපයන්නන් ඔබේ AMEP පාඨමාලාව ආරම්භ වන කාලය හා සමාන්තර ළමා සුරකුම් සේවාවක් ඔබට පිළියෙළ කර දෙනු ඇත. තවද ඔබ පංතියේ සිටින කාලය තුළ ළමා සුරකුම් සේවාවක් කෙසේ හෝ ලබා දීමට ඔවුන් උත්සාහ කරනු ඇත. සමහර අවස්ථාවලදී මෙය සිදුකිරීමට නොහැකි විය හැක. මක් නිසාද යත් ළමා සුරකුම් සේවාවන්ට අධික ඉල්ලුමක් පැවතීම සහ ඒවා සාමාන්‍යයෙන් සීමිත වීම හේතුවෙනි. සමහර අවස්ථාවල පුරප්පාඩු ඉක්මනින්ම සොයා ගත නොහැකි විය හැකි අතර ඔබ පංතිවලට සහභාගී වීමට තවදුරටත් බලා සිටින අතරතුර අර්ධ වශයෙන් ළමා සුරකුම් සේවා ලබා ගත හැකි විය හැක.

නොමිලේ ළමා සුරකුම් සේවා ලබා දෙන්නේ ඔබ AMEPපංතියට සහභාගි වන අතර පමණි. එයAMEP පංතියේ කාල සීමාවෙන් බැහැරව ඔබ සිදු කරන ක්‍රියාකාරකම් සඳහා ලබා ගත නොහැක. ඔබ AMEPපංතියට සහභාගි නොවන විට හෝ ඔබේ අමතර පංති අවසන් වූ විට ඔබ විසින්ම ළමා සුරකුම් සේවා පිළියෙළ කර ගත යුතුය. ඔබේ දරුවා හෝ දරුවන් ඕනෑම කාලයකදී ළමා සුරකුම වෙත නොපැමිණේ නම් ඒ බව ඔබේ AMEP සේවා සපයන්නාට දැන්වීම ඉතා වැදගත්ය. එවිට ඔබේ දරුවන් වෙනුවෙන් වෙන් කරන ලද කාල සීමාවන් වෙනස් කළ හැක.

ඔබට AMEP පංති විශාල ගණනකට සහභාගි වීමට නොහැකි වුනොත් සේවා සපයන්නා ඔබේ ළමා සුරකුම් පුරප්පාඩුව අවලංගු කරනු ඇත. එහෙත් ඔබ AMEPවෙත ආපසු පැමිණි විට ඔබට නැවත නොමිලේ ළමා සුරකුම් සේවා ලබා ගත හැක. එහෙත් ළමා සුරකුම් පුරප්පාඩුවක් නැවත ඇති වන තෙක් බලා සිටීමට ඔබට සිදු වනු ඇත.

ඔබේ ළමා සුරැකුම් සේවා අවශ්‍යතා ඇගයීමට ලක් කරන විට ඔබේ AMEP සේවා සපයන්නා ඔබට හැකි ඉක්මනින් ඉගෙනීම ආරම්භ කළ හැකි වන පරිදි විකල්ප ගණනාවක් ඔබට ඉදිරිපත් කරනු ඇත. නිදසුනක් ලෙස ඔබට පහත සඳහන් දේ කිරීමට සිදු විය හැක:

- එතැනම ළමා සුරැකුම් මධ්‍යස්ථානයක් ඇති ප්‍රජා මධ්‍යස්ථානයක ඉගෙන ගැනීම
- ඔබ කැමති ප්‍රමාණයට වඩා දුර ගමන් කිරීමට සිදු වීම
- ළමා සුරැකුම් පුරප්පාඩුවක් ඇති වන තෙක් නිවසට පැමිණෙන ගුරුවරයෙකු හරහා හෝ දුරස්ථ අධ්‍යාපනය මගින් ඉගෙන ගැනීම.

ළමා සුරැකුම් වැඩ පිළිවෙළ මගින් ඔබේ අවශ්‍යතා සපුරන්නේ නැති නම්, ඔබ මෙය AMEP සේවා සපයන්නා සමග සාකච්ඡා කළ යුතුය.

ළමා සුරැකුම් සේවා පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර ඔබේ AMEP සේවා සපයන්නා අමතන්න.